සියලු ම හිමිකම් ඇවිරිණි.

රහස්‍ය ලේඛනයකි.

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

## අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2024

# 02 - රසායන විද්‍යාව

## ලකුණු දීමේ පටිපාටිය

මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
ප්‍රධාන/ සහකාර පරීක්ෂක රැස්වීමේ දී ඉදිරිපත්වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතුව ඇත.

# අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2024

# 02 - රසායන විද්‍යාව

## ලකුණු බෙදී යාමේ ආකාරය

| | | | | |
|---|---|---|---|---|
| I පත්‍රය | : | 1 X 50 | = | 50 |
| II පත්‍රය | : | | | |
| A කොටස | : | 100 X 4 | = | 400 |
| B කොටස | : | 150 X 2 | = | 300 |
| C කොටස | : | 150 X 2 | = | 300 |
| එකතුව | | | = | 1000 |
| II පත්‍රය – අවසාන ලකුණු | | | = | 100 |



අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාළ ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

# උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරී අනිවාර්යයෙන් ම කළ යුතුවේ. ඒ සඳහා පහත පරිදි කටයුතු කරන්න.

1. උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.

2. සෑම උත්තරපත්‍රයකම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න.

   ඉලක්කම් ලිවීමේදී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.

3. ඉලක්කම් ලිවීමේදී වැරදුණු අවස්ථාවක් වේ නම් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවැ ලියා කෙටි අත්සන යොදන්න.

4. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමඟ □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙ ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරු භාවිත කරන්න.

උදාහරණ : ප්‍රශ්න අංක 03

(i) ............................................ √ $\frac{4}{5}$
............................................
............................................

(ii) ............................................ √ $\frac{3}{5}$
............................................
............................................

(iii) ............................................ √ $\frac{3}{5}$
............................................
............................................

(03) $\frac{4}{5}$ + (ii) $\frac{3}{5}$ + (iii) $\frac{3}{5}$ = $\frac{10}{15}$

**බහුවරණ උත්තරපත්‍ර : (කවුළු පත්‍රය)**

1. අ.පො.ස. (උ.පෙළ) හා තොරතුරු තාක්ෂණ විභාගය සඳහා කවුළු පත්‍ර දෙපාර්තමේන්තුව මගින් සකසා ලැබේ. නිවැරදි වරණ කපා ඉවත් කළ සහතික කරන ලද කවුළුපතක් ඔබ වෙත සපයනු ලැබේ. සහතික ක කවුළු පත්‍රයක් භාවිත කිරීම පරීක්ෂකගේ වගකීම වේ.

2. අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු ක ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැ විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබෙන්න පුළුවන. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්

3. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර 0 ලකුණකි ද වරණ මත ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරු එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න.

**ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :**

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි අඳින්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.

2. ලකුණු සටහන් කිරීමේදී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකටම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් අංක දෙකකින් ලියා දක්වන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණු ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

**ලකුණු ලැයිස්තු සකස් කිරීම :**

සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළදී ගණනය කරනු නොලැබේ. එබැවින් එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතු ය. I පත්‍රය සඳහා බහුවරණ පිළිතුරු පත්‍රයක් පමණක් ඇති විට ලකුණු ලැයිස්තුවට ලකුණු ඇතුළත් කිරීමෙන් පසු අකුරෙන් ලියන්න. අනෙකුත් උත්තරපත්‍ර සඳහා විස්තර ලකුණු ඇතුළත් කරන්න.

***



අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
# Department of Examinations – Sri Lanka
## අ.පො.ස.(උ.පෙළ)විභාගය/G.C.E. (A/L) - 2024

විෂයය අංකය / Subject No: **02**

විෂයය / Subject: **රසායන විද්‍යාව**

## ලකුණු දීමේ පටිපාටිය/Marking Scheme
## I පත්‍රය/Paper I

| ප්‍රශ්න අංකය Question No. | පිළිතුරු අංකය Answer No. | ප්‍රශ්න අංකය Question No. | පිළිතුරු අංකය Answer No. | ප්‍රශ්න අංකය Question No. | පිළිතුරු අංකය Answer No. | ප්‍රශ්න අංකය Question No. | පිළිතුරු අංකය Answer No. | ප්‍රශ්න අංකය Question No. | පිළිතුරු අංකය Answer No. |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. | 5 | 11. | 3 | 21. | 4 | 31. | 4/5 | 41. | 1 |
| 02. | 2 | 12. | 2 | 22. | 3 | 32. | 5 | 42. | 1 |
| 03. | 4 | 13. | 3 | 23. | 4 | 33. | 3 | 43. | 1 |
| 04. | 4 | 14. | 1 | 24. | 1 | 34. | 3 | 44. | 1 |
| 05. | 2 | 15. | 3 | 25. | 1 | 35. | 3 | 45. | 2 |
| 06. | 4 | 16. | 2 | 26. | 4 | 36. | 4 | 46. | 3 |
| 07. | 5 | 17. | 4 | 27. | 2 | 37. | 5 | 47. | 4 |
| 08. | 3 | 18. | 5 | 28. | 5 | 38. | 1 | 48. | 3 |
| 09. | 3 | 19. | 5 | 29. | (all) | 39. | 2 | 49. | 1 |
| 10. | 5 | 20. | 2 | 30. | 5 | 40. | 2 | 50. | 1 |

✪ විශේෂ උපදෙස්/Special Instructions:

එක් පිළිතුරකට ලකුණු 01 බැගින්/ 01 Mark for each question

මුළු ලකුණු/Total Marks 01 × 50 = 50

## A කොටස - ව්‍යුහගත රචනා

ප්‍රශ්න හතරටම මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න. (එක් එක් ප්‍රශ්නය සඳහා නියමිත ලකුණු ප්‍රමාණය 100 කි.)

1. (*a*) පහත සඳහන් ප්‍රකාශ **සත්‍ය** ද නැතහොත් **අසත්‍ය** ද යන බව තිත් ඉරි මත සඳහන් කරන්න. හේතු අවශ්‍ය නැත.

(i) කැතෝඩ කිරණ සහ $\beta$ කිරණ යන දෙකෙහිම අංශුවල ආරෝපණය සහ ස්කන්ධය අතර අනුපාතය ($e/m$) එකම වේ. ..... සත්‍ය .....

(ii) කොපර් (Cu) පරමාණුවක චුම්බක ක්වොන්ටම් අංකය $m_l = -1$ වන ඉලෙක්ට්‍රෝන 6 ක් ඇත. ..... සත්‍ය .....

(iii) $F_2ClO^+$ අයනයට තලීය ත්‍රිකෝණාකාර හැඩයක් ඇත. ..... අසත්‍ය .....

(iv) F, S සහ Cl මූලද්‍රව්‍ය අතුරෙන් සල්ෆර් (S) වලට **අඩුම** පළමු අයනීකරණ ශක්තිය ඇත. ..... සත්‍ය .....

(v) කැටායනවල ධ්‍රැවීකරණ බලය සහ ඇනායනවල ධ්‍රැවණශීලතාව හා සම්බන්ධ නීති, KF වලට වඩා LiCl වල ද්‍රවාංකය **ඉහළ** බව පුරෝකථනය කරයි. ..... අසත්‍ය .....

(vi) නයිට්‍රස් අම්ලය ($HNO_2$) හි, N — O බන්ධන දෙක දිගින් සමාන ය. ..... අසත්‍ය .....

(vii) $CN_2^{2-}$ අයනය සඳහා ඇඳිය හැකි ලුවිස් තිත්-ඉරි ව්‍යුහ (සම්ප්‍රයුක්ත ව්‍යුහ) සංඛ්‍යාව 3 කි. ..... සත්‍ය .....

(viii) හෙක්සේන් (hexane) වල තාපාංකය 2, 2-ඩයිමෙතිල්බියුටේන් (2, 2-dimethylbutane) හි එම අගයට වඩා ඉහළ ය. ..... සත්‍ය .....

**(ලකුණු 04 X 8 = ලකුණු 32)**

| **1(a): ලකුණු 32** |
|---|

(*b*) (i) $ISO_4F$ අණුව සඳහා **වඩාත්ම** පිළිගත හැකි ලුවිස් තිත්-ඉරි ව්‍යුහය අඳින්න. එහි සැකිල්ල පහත දක්වා ඇත.




**(ලකුණු 06)**

(ii) ඉහත (i) හි අඳින ලද ව්‍යුහයේ S සහ I පරමාණුවල ඔක්සිකරණ අංක දෙන්න.

S ..... +5 හෝ +V ....., I ..... +4 හෝ +IV ..... **(01) + (01)**

**(i) කොටස නිවැරදි නම් පමණක් (ii) කොටසට ලකුණු දෙන්න.**



අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

(iii) HNCO අණුව සඳහා පිළිගත හැකි (ස්ථායි) ලුවිස් තිත්-ඉරි ව්‍යුහයක් පහත දී ඇත. මෙම අණුව සඳහා තවත් ලුවිස් තිත්-ඉරි ව්‍යුහ (සම්ප්‍රයුක්ත ව්‍යුහ) දෙකක් ඇඳ ඒවායේ ස්ථායිතාවයන් දී ඇති ව්‍යුහයට සාපේක්ෂව දැක්වීමට එම ව්‍යුහ යටින් ස්ථායි හෝ අඩු ස්ථායි හෝ අස්ථායි වශයෙන් ලියන්න.



(අඩු ස්ථායි) (අස්ථායි)

**(ව්‍යුහයට ලකුණු 02) + (ස්ථායිතාවයට ලකුණු 01)**
**(ලකුණු 06)**

(iv) පහත සඳහන් ලුවිස් තිත්-ඉරි ව්‍යුහය සහ එහි ලේබල් කරන ලද සැකිල්ල පදනම් කරගෙන දී ඇති වගුව සම්පූර්ණ කරන්න.



| | | $N^1$ | $N^2$ | $N^3$ | $N^4$ |
|---|---|---|---|---|---|
| I | පරමාණු වටා VSEPR යුගල් සංඛ්‍යාව | 4 | 3 | 3 | 2 |
| II | පරමාණුව වටා ඉලෙක්ට්‍රෝන යුගල් ජ්‍යාමිතිය | චතුස්තලීය | තලීය ත්‍රිකෝණාකාර | තලීය ත්‍රිකෝණ | රේඛීය |
| III | පරමාණුව වටා හැඩය | පිරමිඩීය/ ත්‍රි ආනති පිරමිඩීය | තලීය ත්‍රිකෝණාකාර | කෝණික/ V හැඩැති | රේඛීය |
| IV | පරමාණුවේ මුහුම්කරණය | $sp^3$ | $sp^2$ | $sp^2$ | $sp$ |

**(ලකුණු 01 X 16 = ලකුණු16)**

- කොටස් (v) සිට (viii), ඉහත (iv) කොටසෙහි දෙන ලද ලුවිස් තිත්-ඉරි ව්‍යුහය මත පදනම් වේ. පරමාණු ලේබල් කිරීම (iv) කොටසෙහි ආකාරයටම වේ.

(v) පහත දැක්වෙන පරමාණු දෙක අතර σ බන්ධන සෑදීමට සහභාගි වන පරමාණුක/මුහුම් කාක්ෂික හඳුනාගන්න.

| | | | |
|---|---|---|---|
| I. | $H-N^1$ | H: 1s | $N^1$: $sp^3$ |
| II. | $N^1-N^2$ | $N^1$: $sp^3$ | $N^2$: $sp^2$ |
| III. | $N^2-O$ | $N^2$: $sp^2$ | O: $2p$ / $sp^3$ |
| IV. | $N^2-N^3$ | $N^2$: $sp^2$ | $N^3$: $sp^2$ |
| V. | $N^3-N^4$ | $N^3$: $sp^2$ | $N^4$: sp |
| VI. | $N^4-C$ | $N^4$: sp | C: $2p$ / sp |

(ලකුණු 01 X 12 = ලකුණු12)

(vi) පහත දැක්වෙන පරමාණු දෙක අතර π බන්ධන සෑදීමට සහභාගි වන පරමාණුක කාක්ෂික හඳුනාගන්න.

| | | | |
|---|---|---|---|
| I. | $N^2-N^3$ | $N^2$: 2p | $N^3$: 2p |
| II. | $N^4-C$ | $N^4$: 2p | C: 2p |
| | | $N^4$: 2p | C: 2p |

(ලකුණු 01 X 6 = ලකුණු 06)

(vii) $N^1$, $N^2$, $N^3$ සහ $N^4$ පරමාණු වටා ආසන්න බන්ධන කෝණ සඳහන් කරන්න.

$N^1$ (107° ± 1) $N^2$ (120° ± 1) $N^3$ (117° ± 2) $N^4$ (180° ± 1) (ලකුණු 01 X 4 = ලකුණු 04)

(viii) $N^1$, $N^2$, $N^3$ සහ $N^4$ පරමාණු ඒවායේ විද්‍යුත් සෘණතාවයන් **වැඩිවන** පිළිවෙළට සකසන්න.

$N^1$ < $N^3$ < $N^2$ < $N^4$ (ලකුණු 04)

**1(b): ලකුණු 56**



අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

(*c*) වරහන් තුළ දක්වා ඇති ගුණය **වැඩිවන** පිළිවෙළට පහත සඳහන් විශේෂ සකසන්න. හේතු අවශ්‍ය නැත.

(i) B, O, F, S, Na, Mg (විද්‍යුත් සෘණතාව)

Na < Mg < B < S < O < F **(ලකුණු 06)**

(ii) $K^+$, $Mg^{2+}$, $Ca^{2+}$, $Al^{3+}$, $Cl^-$, $S^{2-}$ (අයනික අරය)

$Al^{3+}$ < $Mg^{2+}$ < $Ca^{2+}$ < $K^+$ < $Cl^-$ < $S^{2-}$ **(ලකුණු 06)**

**1(c): ලකුණු 12**

**2.** (*a*) (i) I. **X** යනු තැඹිලි පැහැති අයනික සංයෝගයකි. එය 7:2:2 අනුපාතයෙන් ඇති මූලද්‍රව්‍ය තුනකින් සමන්විත වේ (රසායනික සූත්‍රය ලිවීමේ අනුපිළිවෙළට නොවේ). මේවායින් දෙකක්, ආවර්තිතා වගුවේ එකම ආවර්තයට අයත් ලෝහ වේ. මෙම ලෝහ දෙකෙන් එකක්, *s*-ගොනුවට අයත් වන අතර, අනෙක *d*-ගොනුවට අයත් වේ. *d*-ගොනුවේ ලෝහය විද්‍යුත් ලෝහාලේපනයේදී බහුලව භාවිත කරයි.

**X** හඳුනාගන්න. $K_2Cr_2O_7$

II. **Y** යනු ඛනිජ අම්ලයකි. එය 1:2:4 අනුපාතයෙන් ඇති මූලද්‍රව්‍ය තුනකින් සමන්විත වේ (රසායනික සූත්‍රය ලිවීමේ අනුපිළිවෙළට නොවේ). **Y** හි ඇති එක් මූලද්‍රව්‍යයක් **X** හි ද අඩංගු වේ. පොස්පේට පොහොර නිපදවීම සඳහා **Y** භාවිත වේ.

**Y** හඳුනාගන්න. $H_2SO_4$

III. **Z** යනු කටුක ගඳක් ඇති ත්‍රි-පරමාණුක වායුවකි. එයට V-හැඩයක් ඇත. එය **Y** නිෂ්පාදනයේදී භාවිත වේ.

**Z** හඳුනාගන්න. $SO_2$ **(ලකුණු 06 x 3 = ලකුණු 18)**

(ii) **X** හි අඩංගු ලෝහ දෙකෙහි ඔක්සිකරණ අංක හා ඉලෙක්ට්‍රෝනික වින්‍යාස ලියන්න.

ලෝහය K ඔක්සිකරණ අංකය +I ඉලෙක්ට්‍රෝනික වින්‍යාසය $1s^22s^22p^63s^23p^6$ හෝ $1s^22s^22p^63s^23p^63p^64s^1$

ලෝහය Cr ඔක්සිකරණ අංකය +VI ඉලෙක්ට්‍රෝනික වින්‍යාසය $1s^22s^22p^63s^23p^6$ හෝ $1s^22s^22p^63s^23p^63d^54s^1$

**(ලකුණු 02 x 6 = ලකුණු12)**

(iii) I. **Z** උපයෝගී කොට **Y** නිෂ්පාදනය කරන ක්‍රියාවලිය නම් කරන්න.

ස්පර්ශ ක්‍රමය

(ලකුණු 02)

II. **Z**, $O_2(g)$ සමඟ ප්‍රතික්‍රියා කර සෑදෙන වායුව **Y** වල සාන්ද්‍ර ද්‍රාවණයක දිය කළ විට **P** සංයෝගය ලබා දේ. **P** සංයෝගය ජලය සමඟ ප්‍රතික්‍රියා කළ විට නැවත **Y** ලබා දේ. **P** සංයෝගයේ නාම සහ රසායනික සූත්‍රය ලියන්න.

නාම ඔලියම්/ පයිරොසල්ෆියුරික් අම්ලය / සධූම සල්ෆියුරික් අම්ලය / ඩයිසල්ෆියුරික් අම්ලය

රසායනික සූත්‍රය **(P)** $H_2S_2O_7$

(ලකුණු 04 x 2 = ලකුණු 08)

(iv) **X**, **Y** හා **Z** එකට ප්‍රතික්‍රියා කළ විට සිදුවන ප්‍රතික්‍රියාව සඳහා තුලිත රසායනික සමීකරණය ලියන්න.

$K_2Cr_2O_7(aq) + H_2SO_4(aq) + 3SO_2(g) \rightarrow K_2SO_4(aq) + Cr_2(SO_4)_3(aq) + H_2O(l)$

(ලකුණු 10)

හෝ

$Cr_2O_7^{2-}(aq) + 3SO_2(g) + 2H^+(aq) \rightarrow 2Cr^{3+}(aq) + 3SO_4^{2-}(aq) + H_2O(l)$ (ලකුණු 06)

**2(a): ලකුණු 50**

භෞතික අවස්ථා අවශ්‍ය නැත.



අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාළ ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

(*b*) $BaCl_2$, NaI, $Pb(NO_3)_2$, තනුක HCl, $Al_2(SO_4)_3$, $AgNO_3$, සාන්ද්‍ර $NH_4OH$ හා තනුක $NH_4OH$ හි ජලීය ද්‍රාවණ **A, B, C, D, E, F, G** හා **H** ලෙස ලේබල් කර ඇති බෝතල් අටක් (පිළිවෙළට නොවේ) ශිෂ්‍යයෙකුට දෙන ලදී. ඒවා හඳුනාගැනීම සඳහා වරකට ද්‍රාවණ දෙක බැගින් මිශ්‍ර කිරීමෙන් ලැබුණු සමහර ප්‍රයෝජනවත් නිරීක්ෂණ පහත දක්වා ඇත.

| | මිශ්‍ර කළ ද්‍රාවණ | නිරීක්ෂණය |
|---|---|---|
| I. | **A + C** | උණු ජලයෙහි ද්‍රාව්‍ය කහ පැහැති අවක්ෂේපයක් |
| II. | **B + C** | **H** හි අද්‍රාව්‍ය කහ පැහැති අවක්ෂේපයක් |
| III. | **A + E** | උණු ජලයෙහි ද්‍රාව්‍ය සුදු පැහැති අවක්ෂේපයක් |
| IV. | **B + E** | **D** හි ද්‍රාව්‍ය සුදු පැහැති අවක්ෂේපයක් |
| V. | **E + F** | **G** හි අද්‍රාව්‍ය සුදු පැහැති අවක්ෂේපයක් |
| VI. | **A + F** | **G** හි අද්‍රාව්‍ය සුදු පැහැති අවක්ෂේපයක් |
| VII. | **D + G** | අවර්ණ ද්‍රාවණයක් |
| VIII. | **H + G** | අවර්ණ ද්‍රාවණයක් |

(i) **A** සිට **H** හඳුනාගන්න.

**A** $Pb(NO_3)_2$

**B** $AgNO_3$

**C** NaI

**D** තනුක $NH_4OH$

**E** $BaCl_2$

**F** $Al_2(SO_4)_3$

**G** තනුක HCl

**H** සාන්ද්‍ර $NH_4OH$

**(ලකුණු 04 x 8 = ලකුණු 32)**

(ii) I සිට VI එක් එක් ප්‍රතික්‍රියාවෙහි අවක්ෂේප සෑදීම සඳහා තුලිත රසායනික සමීකරණ දෙන්න. අවක්ෂේපයක් දැක්වීමට ↓ සලකුණ භාවිත කරන්න.

I. $Pb(NO_3)_2 + 2NaI \rightarrow PbI_2\downarrow + 2NaNO_3$

II. $AgNO_3 + NaI \rightarrow AgI\downarrow + NaNO_3$

III. $Pb(NO_3)_2 + BaCl_2 \rightarrow PbI_2\downarrow + Ba(NO_3)_2$

IV. $2AgNO_3 + BaCl_2 \rightarrow 2AgCl\downarrow + Ba(NO_3)_2$

V. $3BaCl_2 + Al_2(SO_4)_3 \rightarrow 3BaSO_4\downarrow + 2AlCl_3$

VI. $3Pb(NO_3)_2 + Al_2(SO_4)_3 \rightarrow 3PbSO_4\downarrow + 2Al(NO_3)_3$

**(ලකුණු 03 x 6 = ලකුණු 18)**

සටහන **:** අවක්ෂේප දැක්වීම සඳහා ↓ යොදා නොමැති නම් ලකුණු 01 ක් අඩු කරන්න.

**2(b): ලකුණු 50**

3. (*a*) උෂ්ණත්වය 25 °C දී $H_2CO_3(aq)$ අම්ලයේ විඝටන නියත
$K_1 = 4.5 \times 10^{-7}$ mol dm$^{-3}$ සහ $K_2 = 4.7 \times 10^{-11}$ mol dm$^{-3}$ වේ.

(i) $H_2CO_3(aq)$ වල පළමු සහ දෙවන විඝටන සඳහා සමතුලිත ප්‍රතික්‍රියා ලියන්න.

**සටහන: භෞතික අවස්ථා අවශ්‍ය වේ.**
**සියළු ප්‍රතික්‍රියා සඳහා සමතුලිතතාවයේ සංකේතය ⇌ අවශ්‍ය වේ.**

1වන විඝටනය: $H_2CO_3(aq) + H_2O(l) \rightleftharpoons H_3O^+(aq) + HCO_3^-(aq)$ ...... **(05)**
හෝ $H_2CO_3(aq) \rightleftharpoons H^+(aq) + HCO_3^-(aq)$

2 වන විඝටනය: $HCO_3^-(aq) + H_2O(l) \rightleftharpoons H_3O^+(aq) + CO_3^{2-}(aq)$ ... **(05)**
හෝ $HCO_3^-(aq) \rightleftharpoons H^+(aq) + CO_3^{2-}(aq)$

(ii) පළමු විඝටනය සලකමින් 25 °C දී 0.05 mol dm$^{-3}$ $H_2CO_3(aq)$ ද්‍රාවණයක $H_3O^+(aq)$ සහ $HCO_3^-(aq)$ සාන්ද්‍රණ ගණනය කරන්න.

$$K_1 = \frac{[H_3O^+(aq)][HCO_3^-(aq)]}{[H_2CO_3(aq)]}$$ **(05)**

$$H_2CO_3(aq) + H_2O(l) \rightleftharpoons H_3O^+(aq) + HCO_3^-(aq)$$

| | $H_2CO_3(aq)$ | $H_3O^+(aq)$ | $HCO_3^-(aq)$ | |
|---|---|---|---|---|
| ආරම්භක සාන්ද්‍රණය | 0.05 | 0 | 0 | mol dm$^{-3}$ |
| සාන්ද්‍රණ වෙනස | $-x$ | $x$ | $x$ | mol dm$^{-3}$ |
| සමතුලිත සාන්ද්‍රණය | $0.05 - x$ | $x$ | $x$ | mol dm$^{-3}$ |

**(05)**

$$K_1 = 4.50 \times 10^{-7} = \frac{x.x}{0.05 - x} \approx \frac{x^2}{0.05}$$ **(05)**

$x^2 = 225 \times 10^{-10}$

$x = 1.5 \times 10^{-4}$ mol dm$^{-3}$ **(04 + 01)**

$[H_3O^+(aq)] = [HCO_3^-(aq)] = 1.5 \times 10^{-4}$ mol dm$^{-3}$ **(04 + 01)**

(iii) දෙවැනි විඝටනය සලකමින්, ද්‍රාවණයේ $[CO_3^{2-}(aq)]$ ආසන්න වශයෙන් $K_2$ වලට සමාන බව පෙන්වන්න. ගන්නා ලද උපකල්පන/ය සඳහන් කරන්න.

$$K_2 = \frac{[H_3O^+(aq)][CO_3^{2-}(aq)]}{[HCO_3^-(aq)]}$$ **(05)**

$$HCO_3^-(aq) + H_2O(l) \rightleftharpoons H_3O^+(aq) + CO_3^{2-}(aq)$$

| | $HCO_3^-(aq)$ | $H_3O^+(aq)$ | $CO_3^{2-}(aq)$ |
|---|---|---|---|
| ආරම්භක සාන්ද්‍රණ | $1.5 \times 10^{-4}$ | $1.5 \times 10^{-4}$ | 0 mol dm$^{-3}$ |
| සාන්ද්‍රණ වෙනස | $-y$ | $1.5 \times 10^{-4} + y$ | $y$ mol dm$^{-3}$ |
| සමතුලිත සාන්ද්‍රණ | $1.5 \times 10^{-4} - y$ | $1.5 \times 10^{-4} + y$ | $y$ mol dm$^{-3}$ |

**(05)***

$$K_2 = 4.70 \times 10^{-11} = \frac{(1.5 \times 10^{-4} + y).y}{(1.5 \times 10^{-4} - y)} \approx y$$ **(05)***

***$HCO_3^-$ වලින් විඝටනය වූ ප්‍රමාණය ඉතා කුඩා බවත් $H_3O^+$ හි එකතු වූ ප්‍රමාණය ඉතා කුඩා බවත්, එබැවින් විශේෂ දෙකෙහි සාන්ද්‍රණ වෙනස නොසැලකිය හැකි බවත් ශිෂ්‍යයා වචන වලින් ලියන්නේ නම්, මෙම ලකුණු 05 + 05 ලබා දෙන්න.**

$$[CO_3^{2-}(aq)] \approx K_2$$ **(05**

උපකල්පනය : 1 වන විඝටනයට සාපේක්ෂව 2 වන විඝටනය ඉතා කුඩා බව **(05**

**3(a): ලකුණු 60**



අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

(*b*) උෂ්ණත්වය 25 °C දී 0.01 mol $dm^{-3}$ $Al^{3+}(aq)$ අයන සහ 0.01 mol $dm^{-3}$ $Ag^{+}(aq)$ අයන අඩංගු ජලීය ද්‍රාවණයක් ඔබට සපයා ඇත. එම ද්‍රාවණයේ 1.0 $dm^3$ කට, සාන්ද්‍ර $PO_4^{3-}(aq)$ අයන ද්‍රාවණයක් නොනවත්වා කලතමින්, බිංදුව බැගින් එකතු කරන ලදී.

උෂ්ණත්වය 25 °C දී,

$K_{sp}(AlPO_4) = 1.3 \times 10^{-20}$ mol$^2$ dm$^{-6}$ සහ $K_{sp}(Ag_3PO_4) = 8.1 \times 10^{-12}$ mol$^4$ dm$^{-12}$ වේ.

(i) $PO_4^{3-}(aq)$ ද්‍රාවණය එක් කිරීමේදී සිදු විය හැකි පරිමා වෙනස නොසලකමින්, මිශ්‍රණයෙන් පළමුව අවක්ෂේප වන ලෝහ අයනය ($Al^{3+}$ හෝ $Ag^{+}$) කුමක්දැයි සඳහන් කරන්න. සුදුසු ගණනය කිරීමක් පදනම් කරගනිමින් ඔබගේ පිළිතුර සඳහා හේතු දක්වන්න.

සෑදෙන අවක්ෂේප $AlPO_4$ සහ $Ag_3PO_4$

***AlPO₄* සඳහා**

$$AlPO_4(s) \rightleftharpoons Al^{3+}(aq) + PO_4^{3-}(aq) \quad \textbf{(02)}$$

$$K_{sp} = [Al^{3+}(aq)][PO_4^{3-}(aq)] \quad \textbf{(02)}$$

$$1.30 \times 10^{-20} = 0.01 \times [PO_4^{3-}(aq)] \quad \textbf{(04)}$$

**$AlPO_4(s)$ අවක්ෂේප වීම සඳහා අවශ්‍ය** ; $[PO_4^{3-}(aq)] = 1.30 \times 10^{-18}$ mol dm$^{-3}$ **(03+01)**

**$Ag_3PO_4$ සඳහා**

$$Ag_3PO_4(s) \rightleftharpoons 3Ag^{+}(aq) + PO_4^{3-}(aq) \quad \textbf{(02)}$$

$$K_{sp} = [Ag^{+}(aq)]^3[PO_4^{3-}(aq)] \quad \textbf{(02)}$$

$$8.10 \times 10^{-12} = (0.01)^3 \times [PO_4^{3-}(aq)] \quad \textbf{(04)}$$

**$Ag_3PO_4(s)$ අවක්ෂේප වීම සඳහා අවශ්‍ය** ; $[PO_4^{3-}(aq)] = 8.10 \times 10^{-6}$ mol dm$^{-3}$ **(03+01)**

$$[PO_4^{3-}(aq)]_{AlPO_4(s)} < [PO_4^{3-}(aq)]_{Ag_3PO_4(s)} \quad \textbf{(04)}$$

$AlPO_4(s)$ පළමුව අවක්ෂේප වේ. **(04)**

(ii) දෙවෙනි අයනය අවක්ෂේප වීම ආරම්භ වන විට පළමුව අවක්ෂේප වූ අයනයේ සාන්ද්‍රණය ගණනය කරන්න.

$AlPO_4(s)$ අවක්ෂේප වූ පසු ද්‍රවණය තුළ ඉතිරිව ඇති $[Al^{3+}aq)]$ $= \frac{K_{sp(AlPO_4(s))}}{8.10 \times 10^{-6}}$ **(04)**

ද්‍රවණය තුළ ඉතිරිව ඇති $[Al^{3+}(aq)]$ $= \frac{1.30 \times 10^{-20}}{8.10 \times 10^{-6}}$

$= 1.6 \times 10^{-15}$ mol dm$^{-3}$ **(03+01)**

**3(b): ලකුණු 40**

4. (a) ● අණුක සූත්‍රය $C_5H_{10}O_3$ ක් වූ **A** කාබනික සංයෝගය වැඩිපුර $PCl_5$ සමග ප්‍රතික්‍රියා කර සාපේක්ෂ අණුක ස්කන්ධය 155 ක් වූ **B** සංයෝගය සාදයි. **A** සංයෝගය ජලීය $Na_2CO_3$ සමග $CO_2$ මුක්ත කරයි.
(C = 12.0, H = 1.0, O = 16.0, Cl = 35.5)

(i) **A** සංයෝගයේ පවතින ක්‍රියාකාරී කාණ්ඩ ලියන්න.

OH / හයිඩ්‍රොක්සි / හයිඩ්‍රොක්සිල් , COOH / කාබොක්සිලික් අම්ලය

**සටහන :** "අම්ලය" ලෙස ලියා නොමැති නම් ලකුණු ප්‍රදානය නොකරන්න.

(ලකුණු 05 x 2 = ලකුණු 10

● **A** සංයෝගය ප්‍රකාශ සමාවයවිකතාවය නොපෙන්වයි. **A** සංයෝගය පිරිඩිනියම් ක්ලෝරෝක්‍රෝමේට් සමග ප්‍රතික්‍රියා කර **C** සංයෝගය සාදයි. **C** සංයෝගය ඇමෝනීය $AgNO_3$ සමග රිදී කැටපතක් ලබාදෙයි. **B** සංයෝගය ජලය සමග ප්‍රතික්‍රියා කර **D** සංයෝගය සාදයි. **D** සංයෝගය මධ්‍යසාරීය KOH සමග ප්‍රතික්‍රියා කළ විට ද්විත්ව බන්ධනයක් සහිත **E** ඵලය ලබාදෙයි.

(ii) **A, B, C, D** සහ **E** හි ව්‍යුහ අදාළ කොටු තුළ අඳින්න.

**A**: $HOCH_2CH_2CH_2CH_2COOH$

**B**: $ClCH_2CH_2CH_2CH_2COCl$

**C**: $OHCCH_2CH_2CH_2COOH$

**D**: $ClCH_2CH_2CH_2CH_2COOH$

**E**: $H_2C{=}CHCH_2CH_2COOH$
හෝ
$H_2C{=}CHCH_2CH_2COOK$

(ලකුණු 07 x 5 = ලකුණු 35 )



අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාළ ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

- F සංයෝගය A හි ව්‍යුහ සමාවයවිකයක් වේ. F සංයෝගය වැඩිපුර $PCl_5$ සමග ප්‍රතික්‍රියා කර සාපේක්ෂ අණුක ස්කන්ධය 155 ක් වූ G සංයෝගය ලබාදෙයි. F සංයෝගය ජලීය $Na_2CO_3$ සමග $CO_2$ මුක්ත නොකරයි. F සංයෝගය ප්‍රකාශ සමාවයවිකතාවය පෙන්වයි. F සංයෝගය සාන්ද්‍ර HCl/නිර්ජලීය $ZnCl_2$ සමග පිරියම් කළ විට ආවිලතාවක් ලබා නොදෙයි. 2,4-ඩයිනයිට්‍රොෆිනයිල්හයිඩ්‍රසීන් (2,4-DNP) සමග F සංයෝගය වර්ණවත් අවක්ෂේපයක් ලබාදෙන අතර ඇමෝනීය $AgNO_3$ සමග රිදී කැටපතක් ලබාදෙයි.

(iii) F සංයෝගයේ පවතින ක්‍රියාකාරී කාණ්ඩ ලියන්න.

CHO / ඇල්ඩිහයිඩ , OH / හයිඩ්‍රොක්සි / හයිඩ්‍රොක්සිල්

**සටහන :** පිළිතුරු 2ම නිවැරදි නම් ලකුණු 09 ප්‍රදානය කරන්න, එක් පිළිතුරක් පමණක් නිවැරදි නම් ලකුණු 5ක් පමණක් ප්‍රදානය කරන්න

**(ලකුණු 05 + ලකුණු 04 = ලකුණු 09)**

(iv) F සහ G හි ව්‍යුහ අදාළ කොටු තුළ අඳින්න.




**(F)**




**(G)**

**(ලකුණු 07 x 2 = ලකුණු 14)**

**4(a): ලකුණු 68**

(*b*) (i) ඇසිටෝන් තනුක ජලීය NaOH සමග ප්‍රතික්‍රියා කළ විට සෑදෙන H එලයේ ව්‍යුහය අදාළ කොටුව තුළ අඳින්න.

(ii) H හයිඩ්‍රොක්ලෝරික් අම්ලය සමග රත් කළ විට සෑදෙන I එලයේ ව්‍යුහය අදාළ කොටුව තුළ අඳින්න.




**H**




**I**

**(ලකුණු 06 x 2 = ලකුණු 12)**

**4(b): ලකුණු 12**

(c) (i) ඇසිටෝන් සහ HCN අතර සිදු වන ප්‍රතික්‍රියාවේදී සෑදෙන J ඵලයේ ව්‍යුහය අදාළ කොටුව තුළ අඳින්න




J

(ලකුණු 06)

(ii) ඉහත ප්‍රතික්‍රියාවෙහි යාන්ත්‍රණය ලියන්න.




සටහන : $^{-}CN$ වෙනුවට HCN භාවිත කර ඇත්නම් : $^{-}CN$ සඳහා වෙන් කර ඇති ලකුණු 02 අඩු කරන්න.

(ලකුණු 14)

**4(c): ලකුණු 20**



අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

## B කොටස — රචනා

ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න. (එක් එක් ප්‍රශ්නයට ලකුණු 150 බැගින් ලැබේ.)

**සටහන: භෞතික අවස්ථා අවශ්‍ය වේ.**

5. (a) මවුල අනුපාතය පිළිවෙළින් 2:1 වන NO(g) සහ $O_2$(g) මිශ්‍රණයක්, පරිමාව 10 $dm^3$ වන දෘඩ-සංවෘත භාජනයකට ඇතුළත් කර $T$ උෂ්ණත්වයේදී ප්‍රතික්‍රියා කිරීමට ඉඩහරින ලදී. යම් කාලයකට පසු පද්ධතිය පහත දක්වා ඇති සමතුලිතතාවයට $T$ උෂ්ණත්වයේදී එළැඹුණි.

$$2NO(g) + O_2(g) \rightleftharpoons 2NO_2(g)$$

සමතුලිතතාවයේදී පහත දැක්වෙන නිරීක්ෂණ සටහන් කරගන්නා ලදී.

- වායු මිශ්‍රණයේ පීඩනය $32 \times 8.314 \times 10^3$ Pa විය.
- වායු තුනෙහි මුළු මවුල ගණන 0.64 විය.
- $O_2$ වල ස්කන්ධය 6.4 g විය.

(i) සමතුලිතතාවයේදී එක් එක් වායුමය ප්‍රභේදයෙහි සාන්ද්‍රණය mol $dm^{-3}$ වලින් ගණනය කරන්න. (O = 16)

$$2NO(g) + O_2(g) \rightleftharpoons NO_2(g)$$

$O_2$(g) මවුල ප්‍රමාණය $= \frac{6.4\ g}{32\ g\ mol^{-1}} = 0.20$ **(02)**

$O_2$(g) සාන්ද්‍රණය $= \frac{0.20\ mol}{10\ dm^3} = 2.0 \times 10^{-2}$ mol $dm^{-3}$ **(02+01)**

NO(g) මවුල ප්‍රමාණය = 0.40 (2:1 අනුපාතය දී ඇත) **(02)**

NO(g) සාන්ද්‍රණය $= \frac{0.40\ mol}{10\ dm^3} = 4.0 \times 10^{-2}$ mol $dm^{-3}$ **(02+01)**

$NO_2$(g) මවුල ප්‍රමාණය $= 0.64 - (0.40 + 0.20) = 0.04$ **(02)**

$NO_2$(g) සාන්ද්‍රණය $= \frac{0.04\ mol}{10\ dm^3} = 4.0 \times 10^{-3}$ mol $dm^{-3}$ **(02+01)**

(ii) මෙම $T$ උෂ්ණත්වයේදී සමතුලිතතා නියතය, $K_c$ ගණනය කරන්න.

$$K_C = \frac{[NO_2(g)]^2}{[O_2(g)][NO(g)]^2}$$ **(05)**

$$K_C = \frac{[4.0 \times 10^{-3}\ mol\ dm^{-3}]^2}{[2.0 \times 10^{-2}\ mol\ dm^{-3}][4.0 \times 10^{-2}\ mol\ dm^{-3}]^2}$$ **(05)**

$$\mathbf{K_C = 0.50\ mol^{-1}\ dm^3}$$ **(05)**

(iii) මෙම තත්ත්ව යටතේදී උෂ්ණත්වය $T$'වල අගය (K වලින්) ගණනය කරන්න. ගන්නා ලද උපකල්පනා/ය සඳහන් කරන්න.

පරිපූර්ණ වායු ලෙස උපකල්පනය කරමින් (03)

$PV = nRT$ (02)

$T = \frac{PV}{nR}$

$T = \frac{32 \times 8.314 \times 10^3 Pa \times 10 \times 10^{-3} m^3}{0.64\ mol \times 8.314\ Jk^{-1}\ mol^{-1}}$ (05)

$T = 500\ K$ (04+01)

(iv) $2NO_2(g) \rightleftharpoons 2NO(g) + O_2(g)$ යන ප්‍රතික්‍රියාව සඳහා ඉහත (iii) හි නිර්ණය කරන ලද උෂ්ණත්වයේදී සමතුලිතතා නියතය, $K_p$ ගණනය කරන්න.

$2NO_2(g) \rightleftharpoons 2NO(g) + O_2(g)$ යනු ආරම්භක ප්‍රතික්‍රියාවේ ආපසු ප්‍රතික්‍රියාව වේ. (05)

සමතුලිතතා නියතය $K_C'$ නම්,

$K_C' = \frac{1}{K_C}$ (05)

$= \frac{1}{0.50} = 2\ mol\ dm^{-3}$ (04+01)

$K_P = K_C\ (RT)^{\Delta n} \qquad \Delta n = 1$ (03+02)

$K_P = 2\ (8.314\ Jk^{-1}\ mol^{-1} \times 500K)$

$\boldsymbol{K_P = 8.314 \times 10^3\ Pa}$ (04+01)

**5(a): ලකුණු 70**

(b) උෂ්ණත්වය 298 K හි පහත දී ඇති තොරතුරු සලකන්න.

$\Delta H_f^\circ(NO(g)) = 90\ kJ\ mol^{-1}$

$\frac{1}{2}N_2(g) + O_2(g) \rightarrow NO_2(g)\ \ \Delta H^\circ = 33\ kJ\ mol^{-1}$

$4NO_2(g) + O_2(g) \rightarrow 2N_2O_5(g)\ \ \Delta H^\circ = -102\ kJ\ mol^{-1}$

දී ඇති තොරතුරු අනුව

$\Delta H^\theta_{f\ (NO(g))} = 90\ kJ\ mol^{-1}$ ..............................(A)

$\frac{1}{2}N_2(g) + O_2(g) \rightarrow NO_2(g)$:  $\Delta H^\theta = 33\ kJ\ mol^{-1}$ ....................(B)

$4NO_2(g) + O_2(g) \rightarrow 2N_2O_5(g)$:  $\Delta H^\theta = -102\ kJ\ mol^{-1}$ ...........(C)



අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාළ ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

(i) උෂ්ණත්වය 298 K හිදී,

$2NO(g) + O_2(g) \longrightarrow 2NO_2(g)$ යන ප්‍රතික්‍රියාව සඳහා $\Delta H^{\circ}$ ගණනය කරන්න.

අවශ්‍ය ප්‍රතික්‍රියාව : $2NO(g) + O_2(g) \rightarrow 2NO_2(g)$

A වලින් , $\Delta H^{\theta}_{f\,(NO(g))}$ : $\frac{1}{2}N_2(g) + \frac{1}{2}O_2(g) \rightarrow NO(g)$: $\Delta H^{\theta} = 90\ kJ\ mol^{-1}$..(D) **(05)**

**(B) – (D) :** $\frac{1}{2}O_2(g) + NO(g) \rightarrow NO_2(g)$ ........(E) **(05)**

$\Delta H^{\theta} = (33 - 90) = -57\ kJ\ mol^{-1}$ **(05 +05)**

**(E) × 2 :** $2NO(g) + O_2(g) \rightarrow 2NO_2(g)$ $\boldsymbol{\Delta H^{\theta} = -114\ kJ\ mol^{-1}}$ **(04+01)**

හෝ : **(B) × 2 – (D) × 2** : $2NO(g) + O_2(g) \rightarrow 2NO_2(g)$ **(05+05)**

$\Delta H^{\theta} = (66 - 180)\ kJ\ mol^{-1}$ **(05+05)**

$\Delta H^{\theta} = -114\ kJ\ mol^{-1}$ **(04+01)**

හෝ :




හෙස් නියමයට අනුව $\Delta H^{\theta} = \Delta H^{\theta}_2 - \Delta H^{\theta}_1 = (2 \times 33 - 2 \times 90)\ kJ\ mol^{-1}$ **(05)**

$= -114\ kJ\ mol^{-1}$ **(04+01)**

හෝ වෙනත් පිළිගත හැකි ක්‍රමයක්

(ii) උෂ්ණත්වය 298 K හිදී $\Delta H^{\circ}_f(N_2O_5(g))$ ගණනය කරන්න.

$2N_2O_5(g)$ හි උත්පාදනයට අදාළ ප්‍රතික්‍රියාව :

$N_2(g) + \frac{5}{2}O_2(g) \rightarrow N_2O_5(g)$: $\Delta H^{\theta}_f = ?$ **(05)**

තොරතුරු: $\frac{1}{2}N_2(g) + \frac{1}{2}O_2(g) \rightarrow NO(g)$: $\Delta H^{\theta} = 90\ kJ\ mol^{-1}$...... (D)

**(D)×2 :** $N_2(g) + O_2(g) \rightarrow 2NO(g)$: $\Delta H^{\theta} = 180\ kJ\ mol^{-1}$..... (F) **(05+05)**

$2NO(g) + O_2(g) \rightarrow NO_2(g)$ $\Delta H^{\theta} = -114\ kJ\ mol^{-1}$ .... (G)

$4NO_2(g) + O_2(g) \rightarrow 2N_2O_5(g)$: $\Delta H^{\theta} = -102\ kJ\ mol^{-1}$ (C)

**(C) ÷ 2 :** $2NO_2(g) + \frac{1}{2}O_2(g) \rightarrow N_2O_5(g)$: $\Delta H^{\theta} = -51\ kJ\ mol^{-1}$ .....(H) **(05)**

**(F) + (G) + (H):** $N_2(g) + \frac{5}{2}O_2(g) \rightarrow N_2O_5(g)$

$\Delta H^{\theta}_{f\,(N_2O_5(g))} = [180 + (-114) + (-51)]\ kJ\ mol^{-1} = \boldsymbol{15\ kJ\ mol^{-1}}$ **(05+04+01)**

**හෝ :**

$$4NO_2(g) + O_2(g) \xrightarrow{-102} 2N_2O_2(g)$$ **(05)**

**(05)** **4 x 33** $\nearrow$ $\qquad$ $\nearrow$ $2\Delta H^{\theta}_{f(N_2O_5(g))}$ **(05)**

$$2\,N_2(g) + 5O_2(g)$$

**හේස් නියමයට අනුව** $\quad 2\Delta H^{\theta}_{f(N_2O_5(g))} = (4 \times 33 - 102)\ kJ\ mol^{-1}$ **(05+05)**

$\Delta H^{\theta}_{f(N_2O_5(g))} = 15\ kJ\ mol^{-1}$ **(04+01)**

හෝ වෙනත් පිළිගත හැකි ක්‍රමයක්

(iii) ඉහත (ii) හි දී ලැබුණු ප්‍රතිඵල ආධාරයෙන් පහත දෑ පුරෝකථනය කරන්න.

I. $\Delta S^{o}_{f}(N_2O_5(g))$ හි සලකුණ

II. $N_2(g)$ සහ $O_2(g)$ වලින් $N_2O_5(g)$ සෑදීමේ ප්‍රතික්‍රියාවේ ස්වයංසිද්ධතාවය

I. $\quad N_2(g) + \frac{5}{2}O_2(g) \rightarrow N_2O_5(g)$

අඩු වූ මවුල ප්‍රමාණය : මවුල 3.5 $\rightarrow$ මවුල 1 **(05)**

$\Delta H^{\theta}_{S\,(N_2O_5(g))}$ සෘණ ($< 0$) වේ **(05)**

II. $\quad \Delta G^{\theta} = \Delta H^{\theta} - T\Delta S^{\theta}$ **(05)**

= +ve – (+ve)(-ve) = +ve **(05)**

උෂ්ණත්වය 298 K දී ප්‍රතික්‍රියාව ස්වයංසිද්ධ නොවේ. **(05)**

**5(b): ලකුණු 80**



අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

6. (*a*) වායූ සඳහා වූ චාලක අණුක වාදය අනුව පරිපූර්ණ වායුවක් සඳහා $T$ උෂ්ණත්වයේදී $PV = \frac{1}{3}mN\overline{C^2}$ වේ. මෙහි $P$ වායුවේ පීඩනය ද, $V$ වායුවේ පරිමාව ද, $m$ වායු අණුවක ස්කන්ධය ද, $N$ වායු අණු ගණන ද, $\overline{C^2}$ වායුවේ වර්ග මධ්‍යනය වේගය ද වේ.

(i) පරිපූර්ණ වායුවක් සඳහා $\overline{C^2} = \frac{3RT}{M}$ බව පෙන්වන්න. $M$ යනු වායුවේ මවුලික ස්කන්ධය වේ.

**සටහන : භෞතික තත්ත්ව අවශ්‍ය වේ.**

$PV = \frac{1}{3} mN \overline{C^2} = \frac{1}{3} m(nN_A)\overline{C^2}$ : n – මවුල, $N_A$ ඇවගාඩ්රෝ නියතය **(04)**

$= \frac{1}{3} nM\overline{C^2}$ : M-මවුලික ස්කන්ධය **(04)**

$PV = nRT = \frac{1}{3} nM\overline{C^2}$ **(04)**

$\overline{C^2} = \frac{3RT}{M}$ **(04)**

(ii) **A** සහ **B** යනු මවුලික ස්කන්ධයන් පිළිවෙළින් $M_A$ සහ $M_B$ වූ පරිපූර්ණ වායු දෙකකි. උෂ්ණත්වය $T = 300\frac{M_B}{M_A}$ හිදී, **B** වායුවේ වර්ග මධ්‍යනය වේගය $\left(\overline{C_B^2}\right)$, උෂ්ණත්වය $T = 300$ හිදී **A** වායුවේ වර්ග මධ්‍යනය වේගය $\left(\overline{C_A^2}\right)$ ට සමාන බව පෙන්වන්න. (උෂ්ණත්ව කෙල්වින්වලින් දී ඇත.)

A වායුව සඳහා: $\overline{C_A^2} = \frac{3RT}{M_A} = \frac{3R \times 300}{M_A}$ ........................ (1)

B වායුව සඳහා: $\overline{C_B^2} = \frac{3RT}{M_B} = \frac{3R\times 300(\frac{M_B}{M_A})}{M_B} = \frac{3R \times 300}{M_A}$ ............ (2) **(04+04)**

**(1) = (2):** $\overline{C_A^2} = \overline{C_B^2}$ **(04)**

(iii) දී ඇති ඕනෑම $T$ උෂ්ණත්වයකදී **A** සහ **B** වායු දෙකෙහි මවුලික චාලක ශක්තීන් අතර අනුපාතය සඳහා ප්‍රකාශනයක් ව්‍යුත්පන්න කරන්න.

